# ජේ.ආර්. ජයවර්ධන ඓතිහාසික පර්යේෂණ, ලේඛනාගාර හා පුස්තකාල මධ්‍යස්ථානය-2010

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1:1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ජේ.ආර්. ජයවර්ධන ඓතිහාසික පර්යේෂණ, ලේඛනාගාර හා පුස්තකාල මධ්‍යස්ථානය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1:2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ජේ.ආර්. ජයවර්ධන ඓතිහාසික පර්යේෂණ, ලේඛනාගාර හා පුස්තකාල මධ්‍යස්ථානයේ ක්‍රියාකාරිත්වය පිළබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මුල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1:2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 1:2:1 ගිණුම්කරණ අඩුපාඩු

මධ්‍යස්ථානයේ ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම් වෙනවෙනම හදුනා නොගෙන එක් ගිණුමක ඇතුලත් කර තිබූ අතර ඉඩමේ වටිනාකමටද ක්ෂය ප්‍රතිපාදන සලසා තිබුණි.

#### 1:2:2 ආයතනයේ නාමය

1988 අංක 77 දරන ජේ.ආර් ජයවර්ධන මධ්‍යස්ථානය පනත අනුව ආයතනයේ නාමය "ජේ.ආර් ජයවර්ධන ඓතිහාසික පර්යේෂණ, ලේඛනාගාර හා පුස්තකාල මධ්‍යස්ථානය" වුවද අවසන් මූල්‍ය ප්‍රකාශයන්හි "ජේ.ආර් ජයවර්ධන මධ්‍යස්ථානය" ලෙස හා ආයතනය භාවිතා කරනු ලබන ලිපි ශීර්ෂයන්හි "ජයවර්ධන සංස්කෘතික කේන්ද්‍රය" ලෙස භාවිතා කර තිබුණි.

1:2:3 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති යනාදියට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති,රෙගුලාසි යනාදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1988 අංක 77 දරන ජේ.ආර්.ජයවර්ධන ඓතිහාසික පර්යේෂණ, ලේඛනාගාර හා පුස්තකාල මධ්‍යස්ථාන පනත.<br>(i) 3 වගන්තිය | පාලක මණ්ඩලයේ ධූර කාලය 2009 ජනවාරි 25 දින අවසන්ව තිබුණද, පාලක මණ්ඩලයේ සාමාජිකයන් යළි පත්කර නොතිබුණි. |
| | (ii) 4(1) වගන්තිය (අ),(ආ),(ඇ) ඡේද | පොත්පත්, ලියවිලි, ලිපිගොනු, ජායාරූප, චිත්‍රපටි තැටි, ශ්‍රව්‍ය හා දෘෂ්‍ය ටේප් වැනි ද්‍රව්‍ය හා කෞතුකාගාර පුස්තකාලයේ වටිනාකම පිළිබඳ මහජනතාව, ශිෂ්‍යයන් හා පාඨකයින් දැනුවත් කිරීම සඳහා ප්‍රදර්ශන හෝ සම්මන්ත්‍රණ පැවැත්වීමට කටයුතු යොදා නොතිබුණි. |
| | (උ) ඡේදය | 2010 වර්ෂය සඳහා විද්වත් රැස්වීම් පවත්වා නොතිබුණි. |
| (ආ) | 1971 අංක 38 දරන මුදල් පනත<br>14(3) වගන්තිය | 2002 වර්ෂයෙන් පසුව වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණ අතර, පාලන වාර්තාද සකස් කර නොතිබුණි. |
| (ඇ) | අංක පීඊඩී /12 දරන 2003 ජුනි 2 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ<br>(i). 5:1:3 වගන්තිය | සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |
| | (ii). 6:5:1 වගන්තිය | මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද එසේ කර නොතිබූ අතර පෙබරවාරි මාසය අවසානයේදී ඉදිරිපත් කල යුතු අවසන් ගිණුම් ඉදිරිපත් කර තිබුණේ 2011 මාර්තු 29 වැනිදාය. |

| | | |
|---|---|---|
| | (iii). පීඊඩී/33 දරන 2005 දෙසැම්බර් 19 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | 2010 වර්ෂයේදී රාජ්‍ය නොවන මූල්‍ය ආයතනයන්හි රු. 47,482,862 ක් ආයෝජනය කර තිබුණි. |
| (ඈ) | 2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3:4 හා අත්පොතෙහි (i).2:14:1 ජේදය | වැඩ හා සේවාවන් ටෙන්ඩර් පටිපාටිය මගින් හැකිතාක් දුරට මහජන තරඟයට ඉදිරිපත් කළ යුතු වුවද ආරක්ෂක සේවය 2000 වර්ෂයේ සිට පැවත එන අතර තරඟකාරිත්වයට යොමු කර ගිවිසුම් අළුත් කිරීමට කටයුතු කර නොතිබුණි. ආරක්ෂක සේවාව සඳහා 2010 වර්ෂය වෙනුවෙන් රු.1,342,853 ක් ගෙවා තිබුණි. |
| | (ii) 8:13:4 ජේදය | චීන ගොඩනැගිලි සඳහා තරප්පු පෙලක් ඉදිකිරීමේදී රු.2,874,164 ක් වටිනා අමතර වැඩ හා එකතු කිරීම් සඳහා ප්‍රසම්පාදන කමිටුවේ සහ තාක්ෂණික ඇගයීම් කමිටුවේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| | (iii) 3:4 ජේදය | වෙළඳපල මිල සැදැහුම් කැඳවීමෙන් තොරව ආයතනයේ අවශ්‍යතා සඳහා රු.172,271 ක් වටිනා භාණ්ඩ මිලදීගෙන තිබුණි. |
| (ඉ) | 2009 සැප්තැම්බර් 18 දිනැති අංක පීඑෆ්/437 දරන මුදල් චක්‍රලේඛය. | රක්ෂණ ආවරණ ජාතික රක්ෂණභාර අරමුදල හෝ සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලබාගත යුතු වුවද ඉන් බැහැරව ආයතනයේ වාහන 3ක් සඳහා රු.50,856 ක් වැය කර පෞද්ගලික රක්ෂණ ආයතනයකින් රක්ෂණ ආවරණය ලබාගෙන තිබුණි. |

ඊ) <u>මුදල් රෙගුලාසි</u>

| | |
|---|---|
| අංක 756 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. |
| මු.රෙ.1645 (අ) | I පොදු 267 ආකෘතියට අනුව ලොග් පොත් හා පොදු 268 ආකෘතියට අනුව ධාවන සටහන් පවත්වා නොතිබුණි.<br><br>II ධාවන සටහන් සම්පූර්ණ කර ඊලඟ මස 15 දිනට පෙර විගණකාධිපති වෙත එවීමට කටයුතු කර නොතිබුණි. |

**02. කළමනාකරණ අකාර්යක්ෂමතා**

I. සහකාර පුස්තකාලාධිපතිණියගේ කොන්ත්‍රාත් ගිවිසුම අනුව කලින් නොදන්වා සේවය අවසන් කිරීමට එරෙහිව දිස්ත්‍රික් කම්කරු උසාවියේ නඩුවක් පවරා තිබුණි. එම නඩුවේ තීන්දුව අනුව ඇයට වන්දි වශයෙන් වර්ෂයක වැටුප රු 237,570 ක් හා නඩුවේ නිතිඥ ගාස්තු වශයෙන් රු 18,000 ක් ගෙවා තිබුණි. ඒ අනුව ආයතනය විසින් රු 255,570 ක අනාර්ථික වියදමක් දරා තිබුණි.

II. මධ්‍යස්ථානය විසින් 2002 වර්ෂයේදී රු.9,725,000 ක් විධිමත් අනුමැතියකින් තොරව පෞද්ගලික මූල්‍ය ආයතනයක තැන්පත් කර තිබූ අතර එම ආයතනය මූල්‍ය අර්බුදයකට ලක්වීම් නිසා ආයෝජිත මුදල හා සමාලෝචිත වර්ෂය දක්වා අදාළ පොළී ආදායම අය කර ගැනීමේ අවදානමකට ලක්වී තිබෙන බව නිරීක්ෂණය විය.

III. 2010 දෙසැම්බර් 31 දිනට ජංගම ගිණුම් දෙකක රැඳීතිබූ රු.3,877,726 ක අතිරික්ත මුදල් ඵලදායි ලෙස ආයෝජනය කර පොළි ආදායම උපයා ගැනිම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

IV. වීන ගොඩනැගිල්ලේ පළමු මහලේ වර්ග අඩි 4576 ක් හා දෙවන මහලේ වර්ග අඩි 4576 ක් 2010 වර්ෂය තුල කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිශ්කාර්යව පැවතුණි.

## 03. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු. 3,604,119 ක අතිරික්තයක් වූ අතර, ඉකුත් වර්ෂයේ ඊට අනුරූපීව රු. 6,658,565 ක අතිරික්තයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,054,446 ක අඩු වීමක් නිරීක්ෂණය වූ අතර ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණේ ස්ථාවර තැන්පතු පොලී අනුපාත අඩුවීමයි.

## 04. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ආයෝජන

(ආ) ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග